**කරෙයිතිවු ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**--------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 11 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූලි 22 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට කරෙයිතිවු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

**---------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභා කාර්යාලය සහ පුස්තකාලය පිහිටා තිබෙන ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ගිණුම්වල දැක්විය යුතු වේ. | වටිනාකම තක්සේරු කර ඉදිරි ගිණුම් වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන බව දක්වා සිටිමි. |
| (ii) | 2012 වර්ෂයේ අනතුරකට ලක් වී සම්පූර්ණයෙන් හානි වූ ලොරි රථයේ වටිනාකම රු.5,400,000 ක්, ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි. | වාහනයේ වටිනාකම ගිණුම්වලින් ඉවත්කළ යුතු වේ. | ඉදිරි ගිණුම් වර්ෂයේ ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කරමි. |
| (iii) | සභාව සතු වාහන 09 ක් නැගෙනහිර පළාත් සභාවෙන් රු.1,877,000 කට 2018 දෙසැම්බර් මාසයේ දී විකුණා තිබුණ ද, එම වාහනවල වටිනාකම ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් සිදුකළ යුතු වේ. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) ලේඛනමය සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබූ රු. 9,886,142 ක් වටිනා ගිණුම් විෂයන් 05 කට අදාල ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය, වාහන පැවරුම් පොත සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා යන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් ශේෂයන් සනාථ කිරීමේ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉඩම්, ගොඩනැගිලි, මොටර් වාහන පරිත්‍යාග වශයෙන් ලැබුනු ඒවාය. ඒවායේ වටිනාකම දැනුවත්වී නොතිබීම නිසා සමීක්ෂණ මණ්ඩල වාර්තා පිළියෙල කිරීමේ ප්‍රමාදයක් සිදුවිය. මොටර් වාහන සහ පිරියත සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්තාව දැනට ලැබී ඇත. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 217 සහ 218 | ප්‍ර.ස.46 අනුව ඉඩම් සහ ගොඩනැගිලි ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, ඉඩම් හා ලොඩනැගිලි පරීක්ෂාවක් කර නොතිබුණි. | රීති අනුව ක්‍රියාකළ යුතු වේ. | ප්‍ර.ස. 46 අනුව ඉඩම් සහ ගොඩනැගිලි ලේඛන නිසිපරිදි පවත්වා ගෙන යාමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක කාලයක් ඉක්ම වූ රු.272,462 ක් වටිනා තැන්පත් 02 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාල රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදාල තැන්පත් ඉදිරි මුදල් වර්ෂයේ සභාවේ ආදායමට ගැනීමට කටයුතු කරමි. |

### 1.4.2 බදු අවශ්‍යතාවයට අනුකූල නොවීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතිය ගොඩනැගීම් බදු සහ රඳවා ගැනීමේ බදු රු.272,462 ක් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට නොගෙවා වර්ෂ 09 ක කාලයක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි. | අදාල ලියවිලි ලබාගෙන ගැලපීම් කළ යුතු වේ. | මෙම වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන අදායම ඉක්ම වූ වියදම රු.33,201 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු.3,563,514 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 25,000 | -- | -- | -- | 25,000 | 2,500 | 2,500 | -- |
| කුලී | 5,410,000 | 4,727,128 | 4,780,128 | 599,725 | 4,325,000 | 3,978,762 | 3,978,762 | 652,725 |
| බලපත්‍ර ගාස්තු | 5,308,000 | 3,063,894 | 3,337,874 | 3,751,125 | 1,458,000 | 4,045,085 | 3,757,676 | 4,025,105 |
| වෙනත් ආදායම් | 8,160,000 | 7,418,480 | 7,418,480 | -- | 6,717,500 | 5,394,791 | 5,394,791 | -- |
| | **18,903,000** | **15,209,502** | **15,536,482** | **4,350,850** | **12,525,500** | **13,421,138** | **13,133,729** | **4,677,830** |

### 2.2.2 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අයවිය යුතු සන අපද්‍රව්‍ය ඉවත්කිරීමේ ගාස්තු රු.3,725,342 ක් වසර හතරක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අදායම් අදාල කාලවලදී අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කළ යුතු වේ. | අදාල හිඟ මුදල ගෙවන ලෙස ලිපි යවා ඇතත්, හිඟ මුදල මෙතෙක් ලැබී නොතිබුණි. හිඟ මුදල කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව කටයුතු කර ඇත. |
| (ආ) | 1992 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා හිඟව තිබුණු මස්කඩ බදු කුලිය රු. 558,725 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අදායම් අදාල කාලවලදී අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කළ යුතු වේ. | අදාල හිඟ මුදල කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව කටයුතු කර ඇත. |

## 2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව 2018 වර්ෂයේ පවත්වා ගෙන ගිය වර්ග 35 ක ව්‍යාපාර ස්ථාන 125 කින් වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර නොතිබීම හේතුවෙන් රු.102,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | ව්‍යාපාර ස්ථානවලින් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකළ යුතු වේ. | ඉදිරි කාල වලදී වසා ඇති ව්‍යාපාර ස්ථාන සම්බන්ධයෙන් නව ක්‍රියාමාර්ගයක් අනුගමනය කර ව්‍යාපාර ස්ථාවල ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

### අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් විධිමත් කිරීම හා අනෙකුත් ප්‍රධාන කරුණු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් අතුරු ව්‍යවස්ථා 05 ක් සම්බන්ධයෙන් යෝජනා නැගෙනහිර පළාත් පලාන අමාත්‍යවරයාගේ අනුමැතියට යවා තිබුණද, 2019 දෙසැම්බර් 31 දින දක්වා අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වේ. | ඉදිරියේදී අදාල කරුණු සම්බන්ධයෙන්වූ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා අවධානය යොමු කරන බව දන්වා සිටිමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩම සහ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකර ඇති ඉඩම පවරා ගෙන නොතිබුණි. | සභාවේ ඉඩම් සහ ගොඩනැගිලි පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත සේවක සැලැස්ම තුල තනතුරු වර්ග 06 ක පුරප්පාඩු 08 ක් පැවතුනි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල පුරප්පාඩු සඳහා ආදේශ පදනමින් සේවකයන් යොදවා ඇති බව දන්වා සිටිමි. තවද, පළාත් පාලන කොමසාරිස් සහ අමාත්‍යාංශයේ ලේකම් වෙත පුරප්පාඩු පිළිබඳ විස්තර යවා ඇත. |
| (ආ) | නිලධාරින් 07 දෙනෙකුගෙන් රු.40,647 ක හිඟ සේවක ණය ශේෂයක් 2006 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ සේවක ණය අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කළ යුතු වේ. | දැනට එම හිඟ ණය ශේෂ කපා හැරීමට කටයුතු කර ඇති අතර, අයකර ගත හැකි අයගෙන් අයකර ගැනීමටද තීරණය කළ බව දන්වා සිටිමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ වෙළඳ ආයතනවල ප්‍රදර්ශන කර තිබෙන ප්‍රචාරක දැන්වීම් වලින් ගාස්තු අයකර ගැනීමට අතුරු ව්‍යවස්ථා පනවා නොතිබීමෙන් සභාවට රු.100,000 ක පමණ ආදායම් අහිමි වී තිබුණි. | අදායම් ලබා ගන්නා අතුරු ව්‍යවස්ථා පනවා අනාගතයේ ආදායම් අහිමිවීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළියෙල කරන ලද අතුරු ව්‍යවස්ථා සඳහා පළාත් සභාවේ අනුමැතිය ලැබෙනතෙක් අනුකූත් සභාවන් සඳහා අනුමත කර ඇති අතුරු ව්‍යවස්ථාවන් අනුගමනය කර අප සභාව විසින් ගාස්තු අයකරමින් පවතී. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නඩත්තු හා අළුත්වැඩියා නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු යතුරු පැදි 03 ක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉවත් කිරීමට හෝ අලුත්වැඩියා කර පාවිච්චි කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල වාහන අළුත්වැඩියා සඳහා යන වියදම හා සාපේක්ෂව එහි ප්‍රයෝජන අඩු බැවින් අළුත්වැඩියා නොකර තිබුණි. අදාල වාහන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) නැ.ප. මගින් අපහරන කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර ඇත. |

**3.5.2 නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිරිත වෙරළ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘත්තිය (NECCDEP) මූල්‍ය ආධාර යටතේ රු.14,347,200 ක වටිනාකමකට ඉදිකර 2009 වර්ෂයේදී සභාවට භාරදී තිබූ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 17 ක් වර්ෂ 10 ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුනි. | කඩ කාමර බදු දීමට හෝ වෙනත් අවශ්‍යතාවයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ සභා තීරණය අනුව Food City එකක් විවෘත කිරීමට කටයුතු කර ඇත. ඉදිරියේද අදාල ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගැනීමට හැකි වේ. |

**3.5.3 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට ලබාදී තිබූ ගල් රොල් 02 ක් (Road Roller) සහ කොන්ක්‍රීට් මිශ්‍රණය 01 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | අදාල යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල වාහන අළුත්වැඩියා කිරීම සඳහා යන වියදම හා සාපේක්ෂව එහි ප්‍රයෝජන අඩු බැවින් අළුත්වැඩියා නොකර තිබුණි. අදාල වාහන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) නැ.ප. මගින් අපහරනය කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර ඇත. |

**4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලන**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු ආරම්භ කළ යුතු වේ. | අදාල කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා රැස්වීම් පැවත්වීමට කටයුතු කළ යුතු වේ. | අදාල කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |